**බොරලැස්ගමුව නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
---------------------------

## 1.මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 20 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 04 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ අයවැයගත මුද්දර බදු ආදායමට වඩා වැඩිපුර ලද රු.5,000,000 ක මුද්දර බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් 2015 වර්ෂයේ මුද්දර බදු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාව වෙත ලබා දී තිබුණු රු.3,178,457 ක් වටිනා කැබ්රථය වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද වාරික මුදල් වටිනාකම වන රු.2,825,091 ක මුදල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් මෝටර් රථ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) තවද එම කැබ් රථය වෙනුවෙන් තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති වාරික 4 හි වටිනාකම වූ රු.353,136 ක් පළාත් සභා ණය ගිණුමට බැර කොට අයකරගත හැකි උපයෝගී සේවා ගිණුමට හර කළ යුතු වුවත් එසේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද කැබ් රථයේ අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ වාරික මුදල් වන රු.441,420 ක් සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායමට බැර කළ යුතු වුවත් ණයහිමි ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ආදායම එම අගයෙන් අඩුවෙන් හා ණයහිමි ශේෂය එම අගයෙන් වැඩියෙන් දැක්වුණි. සංශෝධිත මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමේ දී ණයහිමි ගිණුම හර කිරීම වෙනුවට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ

ගිණුමට හර කිරීමෙන් සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල ණයගිමි ශේෂය හා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂය එමගින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වාගෙන යන බද්ධ ඉතුරුම් ගිණුම මත 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උපචිත වී ඇති එකතුව රු.620,410 ක් වූ පොලී ආදායමින් සභාවට අයත් රු.310,205 ක ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැති බව 2014 වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබුණ ද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2015 වර්ෂයට අදාල රු.147,832 ක් වූ පොලී ආදායම ආදායමට ගෙන නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ කර්මාන්ත ණයගිමියන් ලෙස ඉදිකිරීම් ආයතනයකට රු.344,155 ක් වෙන්කර තිබූ නමුත් ඉන් සත්‍ය ලෙස වැය වී තිබුණේ රු.159,714 ක් බැවින් ඉකුත් වර්ෂයේ දී රු.184,441 කින් ණයගිමියන් සඳහා අධිවෙන් කිරීම් කර තිබුණි.

(උ) 2014 වර්ෂයේ කර්මාන්ත ණයගිමියන් ලෙස රත්තනපිටිය ග්‍රාම සංවර්ධන සමිතියට රු.374,661 ක් වෙන්කර තිබුණ ද ඉන් සත්‍ය ලෙස වැය වී තිබුණේ රු.129,528 ක් බැවින් ඉකුත් වර්ෂයේ දී රු.245,133 කින් ණයගිමියන් සඳහා අධිවෙන්කිරීම් කර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 4 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් රු.1,566,747 ක් ද, වැඩියෙන් දැක්වීම් රු.93,873 ක් ද නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

නඩු පැවරුම්වලින් අය විය යුතු රු.56,700 ක බලපත්‍ර ආදායම් ශේෂය 2011 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.20,627,381 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.23,729,900 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකරගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 තථ්‍ය අයකරගත යුතු | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 25,261 | 12,425 | 12,836 | 22,486 | 27,982 | 24,512 |
| බදු කුලී | 1,528 | 1,461 | 67 | 375 | 2,107 | 308 |
| බලපත්‍ර ගාස්තු | 336 | 336 | - | 57 | 513 | 57 |
| වෙනත් ආදායම් | 42,106 | 22,253 | 19,853 | 30,279 | 30,996 | 57,753 |

**2.2.2 වරිපනම් හා බදු**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතු මුළු වරිපනම් හා බදු හිඟය රු. 22,485,632 ක් විය.

**2.2.3 මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂය සඳහා රු.25,000,000 ක මුද්දර බදු ආදායමක් ඇස්තමේන්තුකර "වෙනත් ආදායම්" යන විෂයය යටතේ ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණද, වර්ෂයට අදාලව මුද්දර බදු ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණි.මේ ආකාරයෙන්ම මුදලින් උපයානොගත් ආදායම් ගිණුම්ගත වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.9,896,238 ක අතිරික්තය සත්‍ය වශයෙන් උපයාගත් අතිරික්තයක් නොවීය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 ට අනුව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

මේ සම්බන්ධයෙන් පහත කරුනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයට පෙර සිට පැවත එන රු.206,051 ක් වූ පෙර ගෙවුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂය තුළ රු.34,145 ක නොපිය වූ අත්තිකාරම් ශේෂයක් ද රු.11,000 ක නොපිය වූ සුළු මුදල් ශේෂයක් ද රු.905 ක අගරු චෙක්පත් වටිනාකමක් ද ඇතුලත්ව තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ දී සභාව වෙත ලබා දී තිබූ රු.3,232,282 ක් වටිනා කෘෂ කැබ් රථය, රු.17,649,179 ක් වටිනා බැකෝ ලෝඩර් රථය හා රු.2,655,318 ක් වටිනා වීල් ට්‍රැක්ටර් රථය ප්‍රාග්ධනිත කර තිබුණ ද මෙම වත්කම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1653 ට අනුව වාහනවල මයිලෝ මීටරය ක්‍රියාත්මකව තිබිය යුතු අතර එය ක්‍රියා විරහිත වුවහොත් වහා අළුත්වැඩියා කල යුතු වුවත් සභාවේ වාහන 13 ක මයිලෝ මීටර් දිගු කලක සිට අක්‍රීයව පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) නගර සභාවට යාබදව ප්‍රසිද්ධ වැසිකිළියක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සඳහා බොරලැස්ගමුව බටහිර බී සමෘද්ධි සමිතිය සමඟ 2015 අප්‍රේල් 02 දින ගිවිසුම් ගත වී තිබුණු අතර ගිවිසුමට අනුව අදාළ කර්මාන්තය 2015 ජුලි 02 දින අවසන් කළ යුතුව තිබුණි.කෙසේ වුවද අදාල කර්මාන්තය වැඩ නිමකර සභාවට බාරදී තිබුණේ 2016 මාර්තු 14 දින වුවත් විගණිත දින වූ 2016 මැයි 21 දින වන විටත් අදාල කාර්මික නිලධාරියා විසින් කර්මාන්තය පරීක්ෂා කර වැඩ අවසන් වාර්තාව නිර්දේශ කර සභාවට ඉදිරිපත් කර නොතිබුණි.ගිවිසුමට අනුව කර්මාන්තය නිමකර බාරදීමට ප්‍රමාද වන එක් සතියක් සඳහා රු.1,682.28 ක් බැගින් රු. 60,562 ක දඩ මුදලක් අයකරගත යුතු වුවද එම දඩ මුදල් අය කර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති යටතේ ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති 55 ක් අතරින් ව්‍යාපෘති 6 ක් අවලංගු කර තිබූ අතර නිම නොකළ ව්‍යාපෘති ගණන 02 ක් විය.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 3 සිට සියයට 528 දක්වා විචලනයන් පැවති අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂය සඳහා සභාවේ ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තු කරන ලද එකතු වටිනාකම රු.25,560,000 ක් වූ මුදලින් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ආදායමක් උපයාගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) සභාව විසින් ඇස්තමේන්තුගත කරන ලද වියදම් විෂයයන් 102 ක එකතු වටිනාකම වූ රු.14,877,500 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු වියදමක් දරා නොතිබුණි.

**4.2** **අභ්‍යන්තර විගණනය**

**----------------------**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය